# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 අප්‍රේල් මස 23 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.04.28 දින නිකුත් කරන ලදී)

## මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන)

**2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තියේ (ඉ) සහ (ඊ) ඡේද සංශෝධනය කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතියේ බලපෑම වනුයේ -

(අ) (ඉ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ඇපකර සීමාව සියයට 15 දක්වා වැඩි කිරීම මගින්; සහ

(ආ) දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව පවතින ණය ඉලක්කය 2030 වසර දක්වා ඉදිරියට ගෙනයාම මගින්,

වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට පාදක වන පරමාර්ථ ප්‍රතිශෝධනය කිරීම වේ.

## මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන)

එල්.ඩී.—ඕ. 7/2021

### 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය

1. මේ පනත 2021 අංක  දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2021 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2003 අංක 3 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

2. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (ඉ) ඡේදයේ “සියයට දහයක්” යන වචන ඉවත් කර ඒ වෙනුවට “සියයට පහළොවක්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (ඊ) ඡේදයේ “2020 ජනවාරි මස 1 වන දිනයෙන්”, යන වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට “2030 ජනවාරි මස 1 වන දිනයෙන්” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.